මහව ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මහව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවයගිණුම්කරණ , ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදලින් රු.126,335 ක් වැය කර තිබුණු නමුත් අවසන් නොවූ නඩු කටයුතු 05 ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශ තුල හෙළිදරව් කර නොතිබුණි.	2024 වර්ෂය තුල අවසන් නොවූ නඩු පිළිබඳව විස්තර ඉදිරි වර්ෂයේ සකස් කරන මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කරන බව.	සම්බන්ධිත පාර්ශව සමග සිදුකරන ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වත්කමේ පැවැත්ම, ආයු කාලය, වටිනාකම, වත්කමේ ස්වභාවය වැනි කරුණු මත පදනම්ව වත්කම් වර්ගීකරණය කර ගිණුම්ගත කල යුතු වුවත් පාරිභෝගික භාණ්ඩ ලෙස හඳුනාගත හැකි වජ් පිහි, පුනීල සහ කොඩි රඳවන කුඩා භාජන වැනි ද්‍රව්‍ය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	එම භාණ්ඩ වටිනාකමින් අඩු වුවද දීර්ඝ කාලයක් භාවිතා කිරීම හේතුවෙන් ඉන්වෙන්ට්‍රි ගත කර ඇති බව.	පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.198,877 ක ස්ථාවර තැන්පත් පොළී ආදායම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.	එම වටිනාකම 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් ගලපන බව.	ලැබිය යුතු ආදායම් නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුය.
(ආ)	සභාවට පවරා දී තිබුණු සුසාන භූමි 4 ක සහ කදුරුගහමුල පිටිය ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.	කත්සේරු කර නොමැති වත්කම් ඉදිරියේ දී නිවැරදි කරන බව.	සභාව සතු ඉඩම් තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලේඛන හා තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතු කළ අගය මත බදු රු. 406,337 ක් සතුටුදායක පරිදි සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	එකඟ වන බව.	ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත**			
	143 වගන්තිය	2012 වර්ෂයේ සිදු කළ තක්සේරුවෙන් පසු වරිපනම් බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති නව ගොඩනැගිලි වෙනුවෙන් තාවකාලික තක්සේරුවක් සිදු කොට තිබුණද ඒ අනුව වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.	2008 හා 2012 තක්සේරු කිරීම්වලින් පසු අලුත් දේපළ තක්සේරුවක් කර නොතිබුණු අතර 2024 නව තක්සේරුව මගින් සියළු අළුත් දේපළ තක්සේරු කරන ලදී.	පනත අනුව තක්සේරුව සිදුකර වරිපනම් අය කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති**			
(i)	153 රීතිය	මාසික ආදායම් එකතුව හා ආදායම් හිඟ මුදල් පිළිබද ප්‍රකාශයක් ප්‍රා.ස.07 ආකෘති පත්‍රය ප්‍රකාරව සෑම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයකම හා සෑම උප කාර්යාලයකම පවත්වා ගත යුතු වුවද අඹන්පොල උප කාර්යාලය එවැනි ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.	එකඟ වෙමි.	ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය.

(ii)	154 රීතිය	සියළු උපකාර්යාල සම්බන්ධයෙන් වූ එකතු කිරීම් පිළිබද ගිණුම් ලේඛණයක් ප්‍රා.ස.09 ආකෘති පත්‍රය ප්‍රකාරව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙහි පවත්වා ගත යුතු වුවද එවැනි ලේඛණයක් පවත්වා නොතිබුණි.	ඉදිරි මාසයේ සිට සකස් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	180 සිට 184 දක්වා රීති	සේවක ඇප තැන්පත් කළ යුතු නිලධාරින් 10 දෙනෙකුගෙන් ඇප මුදලක් ලබාගෙන නොතිබුණි.	ඇප තැන්පත් ගත යුතු සියළු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
	මු.රෙ.571	වටිනාකම රු.6,420,300 ක් වූ වසර 02 ක කාලය ඉක්ම වූ තැන්පතු ක් 241සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	වසර 02 ඉක්මවූ මෙතෙක් ආදායමට ගත නොහැකි වූ තැන්පත් මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	**2010 ජූලි 30 දිනැති අංක 2010/02 දරණ පළාත් පාලන චක්‍රලේඛය**			
(i)	05(iv) වගන්තිය	වරිපනම් බදු නිසි පරිදි නොගෙවන ලද දේපල සම්බන්ධයෙන් දේපල තහනම් කිරීමේ නිවේදන නියමිත කාලය තුල නිකුත් කර ක්‍රියාත්මක කිරීම කාලීනව සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේ දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය.
(ii)	05 (x) වගන්තිය	ආදායම් උත්පාදනයට අදාලව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කල යුතු වුවත්, ඒ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.	පිළිගන්නා බව.	අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනිමට කටයුතු කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,864,605 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,802,960 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		වර්ෂය 2024				වර්ෂය 2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් දිනට 31 මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් දිනට 31 මුළු හිඟය
		රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.
(i)	වරිපනම් හා බදු	6,025	5,638	4,617	1,021	5,569	5,458	4,605	852
(ii)	කුලී	9,157	9,034	8,583	451	9,788	8,320	5,242	3,078
(iii)	බලපත්‍ර ගාස්තු	700	964	964	-	728	634	634	-
(iv)	වෙනත් ආදායම්	22,500	22,923	6,866	16,057	22,070	19,174	14,810	4,364
	එකතුව	38,382	38,559	21,030	17,529	38,155	33,586	25,291	8,294

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 38.38 ක් ද බිල්කල ආදායම රු.මිලියන 38.56 ක්ද රැස්කල ආදායම රු.මිලියන 21.03 ක් ද වී තිබුණු අතර, බිල් කල ආදායමින් රු.මිලියන 17.53 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගත යුතුව පැවතුණි.	එකඟ වෙමි.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් හා බදු**		
	වර්ෂයට අදාල වරිපනම් බදු ආදායමින් රු.1,020,797 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පැවතුණි.	අදාළ හිඟ ආදායම් අයකර ගැනීමේ දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් සැලසුම් කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය.

(ඇ) කුලී

2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව තිබුණු රු.2,101,964 ක හිඟ බදු කුලී සහ රු. 407,782 ක හිඟ කඩ කුලී ප්‍රවර්තන වර්ෂය තුලදීත් අයකර ගෙන නොතිබුණි.	අයකර ගත යුතුව ඇති හිඟ බදු මුදල් අය කර ගැනීමට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, හිඟ කඩ කුළී සඳහා දැනුවත් කිරීම්වලින් අනතුරුව හිඟ මුදල් ගෙවීම තුලින් සහ දේපළ පවරා ගෙන නැවත ටෙන්ඩර් කිරීම කරන ලදී. තවදුරටත් අයවිය යුතු හිඟ කඩ කුළී සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	හිඟ කුලී අය කර ගැනිමට කටයුතු කළ යුතුය.

(ඈ) බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු ඇස්තමේන්තු ගත ආදායම රු.754,000 ක් වුවත්, සත්‍ය අයවීම රු.1,110,815 ක් වූයෙන් සියයට 47 කට වැඩි විචලනයක් පැවතුණි. තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර ආදායම් උපරිම කාර්යක්ෂමව රැස් කිරීමට ක්‍රියා කළ යුතුව තිබුණි.	අදාල මුදල් ලබා ගැනීමට ලිපි යොමු කර ඇති බව.	තාත්විකව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා කිසිවක් සම්බන්ධයෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම් දේපල වටිනාකම් කාලීනව තක්සේරු නොකිරිම හේතුවෙන් රු.50, රු.100 වැනි ඉතා අඩු වටිනාකම්වලට ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් සත්‍ය මූල්‍ය තත්ත්වය නිරූපණය නොවන බව නිරීක්ෂණය කෙරේ.	තක්සේරු දෙපාර්තමේන්තුව හරහා ඉදිරියේ දී ඉඩම් ගොඩනැගිලි තක්සේරු කිරීමට කටයුතු කරන බව.	වත්කම්වල සාධාරණ වටිනාකමට ගිණුම්ගත කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 10 ක රු.29,876,953 ක ශේෂයක් පැවති අතර ගිණුම් 04 කට අදාල රු.873,272 ක් වසර 5 කට වඩා පැරණි ශේෂ වී තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් විෂයයන් 16 ක එකතු වටිනාකම රු.29,816,694 ක් වූ අතර, ඒ තුළ ගිණුම් විෂයයන් 6 ක වසර 05 කට වඩා පැරණි රු. 1,431,580 ක් පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	ගිණුම් ශේෂවල පැවැත්ම පරීක්ෂා කර ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර , එම ඉදිකිරීම් නිම කර තිබේද යන්න තහවුරු කර ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.	එකඟ වන බව.	පසු විපරම් කටයුතු සිදු කර තොරතුරු තහවුරු කර ගත යුතුය.
(ආ)	වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය විසින් ප්‍රජා මූල සංවිධාන සඳහා හඳුන්වා දී තිබුණු මාර්ගෝපදේශවලට අනුව ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය හා පාලනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත බලතල ලබා දී තිබුණදසභාව විසින් , ඒ කෙරෙහි අවධානයක් යොමුකර නොතිබුණි.	එකඟ වන බව.	මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රශස්ත තොග මට්ටම් හඳුනාගෙන මනා ගබඩා කලමනාකරණයක් නොකිරීම හේතුවෙන් රු.100,640 ක ලිපි ද්‍රව්‍ය අයිතම වර්ග ක් 10, රු.11,970 ක මුද්‍රිත ලියවිලි අයිතම වර්ග 12ක් හා රු.99,145 ක් වටිනාකමැති වීඊ පහන් අයිතම ක් වසර 10 කට 5 වඩා වැඩි කාලයක සිට උපයෝජනයකින් තොරව ගබඩාවේ පැවතුණි .	මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් ඉවත් කළ නිසාවෙන් එම මුද්‍රණ යන්ත්‍ර සඳහා ඒ වනවිට ගෙන්වා තිබූ ටෝනර් තොග ගබඩාවේ ශේෂ වී ඇති අතර භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසියට ඉදිරිපත් කරන ලදී. මුද්‍රිත ලේඛන අකෘතිය ඉඩ ප්‍රමාණය මදිවීම හේතුවෙන් භාවිතයට නොගන්නා අතර ඉදිරියේ දි අවශ්‍යතාවයක් ඇති වුවහොත් භාවිතයට ගැනීම සඳහා ගබඩා කර ඇති බව.	අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන භාණ්ඩ මිල දී ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ ස්ථාවර වත්කම් තුල ඇතුලත් ඉඩම් කට්ටි ක් සම්බන්ධයෙන් 07අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.	ඉඩම පවරා දීම සම්බන්ධයෙන් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇති බව.	පවරා නොගත් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	වටිනාකම රු.206,070,846 ක් වූ ඉඩම් 48 ක් සහ සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 181 ක් අතුරින් 166 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි.	ප්‍රාදේශිය සභාව වෙත පවරා නොමැති ඉඩම් 48 ක් පවරාදීම සම්බන්ධ කටයුතු මහව සහ අඹන්පොල ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් සිදු කරමින් පවතින බව.	පවරා නොගත් ඉඩම් පවරා ගැනිමට කටයුතු කළ යුතුය.
(ඇ)	ලේඛනගතව පවතින සුසාන භූමි 04 ක් භෞතිකව එම කාර්ය සඳහා භාවිතා නොවන බව තහවුරු කර තිබුණද, ඒවා විධිමත් පරිදි වත්කම් ලේඛණවලින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	පවරා දෙන ලෙස ඉල්ලුම් කර ඇති අඹන්පොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් සුසාන භූමි 04 ක් අවසන් ගම් පිඹුරෙහි නොමැති බැවින් සහ එනමින් සුසාන භූමියක් භාවිතා නොකරන බැවින් පවරා දිය නොහැකි බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව.	පවරා නොගත් ඉඩම් පවරා ගැනිමට කටයුතු කල යුතුය.
(ඈ)	පසුගිය වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් අපහරණය සඳහා නිර්දේශ ලබා දී තිබුණු රු.125,000 ලෝරල් අත් ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	නිශ්ක්‍රීය වත්කම් අපහරණය සඳහා කටයුතු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන වැය වෙනුවෙන් රු.2,178,912 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර රු.17,223,834 ක් වැය කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුව ඉක්මවා රු.15,044,922 ක් හෙවත් සියයට 690 ක් ප්‍රාග්ධන වැය දරා තිබුණි.	අදහස් දක්වා නොමැත.	ඇස්තමේන්තු තාර්කිකව සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	වටිනාකම රු.5,450,000 ක් වූ ප්‍රතිපාදන මුදලකට අය වැය ගත කර තිබුණු කර්මාන්ත 3ක් සමාලෝචිත වර්ෂය තුල රු.1,746,825 ක් වැය කර	ඉදිකිරීම් යටතේ ඉදි කළ බැවින් සහ වාහන නැවතුම් පොලෙහි ඉදිකිරීමට යෝජිතව තිබුණු සැලැස්ම වෙනස්	තාත්වික පදනමකින් අය වැය ඇස්තමේන්තු සකස් කළ යුතුය.

සම්පූර්ණයෙන්ම නිම කර තිබුණි. ඒ අනුව තාත්විකව ඇස්තමේන්තු සකස් නොකිරීම කලමනාකරණයේ පවතින දුර්වලතාවයක් ලෙස පෙන්වා දෙමි.	වූයෙන් ඉහත වෙනස ඇති වී ඇති බව	

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 30 ක් හා අතිරික්තතා 42 ක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවාගත් පෙර පාසල් සහායිකාවන් 03 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.148,650 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.	එකඟ වන බව.	මානව සම්පත උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය තුලින් ආයතනයේ අරමුණු හා පරමාර්ථ ලගා කර ගැනිමට මෙහෙයවිය යුතු අතර අතිරික්ත කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 09 දෙනෙකුගෙන් රු.342,860 ක මුදලක් වසරකට වැඩි කාලයක සිට අය නොවන ශේෂයක්ව පැවතුණි.	එකඟ වන බව.	හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික සැලසුම් තුළ හඳුනාගෙන තිබුණු ක්‍රියාකාරකම් හා ඉලක්ක නිශ්චිතව දක්වා නොතිබුණු අතර සංවර්ධන සැලැස්ම හා ආංශික සැලසුම් අතර විධිමත් සම්බන්ධීකරණයක් නොතිබුණි.	ඉදිරියේ දී සකස් කිරීමට අදාල ක්‍රියාකාරකම් සිදු කරන බව.	අවශ්‍යතා හඳුනාගෙන විධිමත් සම්බන්ධීකරණයක් සහිතව සැලසුම් සකස් කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ආදායම් ශීර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 13 සිට 47 දක්වා විචලනයක් ද වැය විෂයයන් 6 ක ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සියයට 15 සිට 690 දක්වා විචලනයක් පැවතුණි. ඒ අනුව අය වැය මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොමැති බවට නිරීක්ෂණය කෙරේ.	අදහස් දක්වා නොමැත.	අයවැය මූල්‍ය පාලන උපකරණයක් ලෙස උපයෝගී කර ගත යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් ප්‍රමාණවත් පරිදි දැනුවත්ව නොතිබුණු අතර තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර අනුමත කර නොතිබුණි. ඒ හේතුවෙන් තිරසර සංවර්ධන ප්‍රගතිය මිනුම් කිරීමට නොහැකි විය.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය.